www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**15 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2015**

| | | |
|---|---|---|
| **ක්‍රිස්තියානි ධර්මය** | **I, II** | **පැය තුනයි** |
| கிறிஸ்தவம் | **I, II** | *மூன்று மணித்தியாலம்* |
| Christianity | **I, II** | *Three hours* |

## ක්‍රිස්තියානි ධර්මය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** අර්ථවත් නත්තලක් ගත කිරීම සඳහා
(1) එළිමහන් බැති ගී සංදර්ශන පැවැත්විය යුතු ය. (2) නිවෙස්වල ගව ලෙන් නිර්මාණය කළ යුතු ය.
(3) මිතුරු මිතුරියන්ට නත්තල් පත් යැවිය යුතු ය. (4) අවශ්‍යතා ඇති දරුවන් සතුටු කළ යුතු ය.

**2.** "මනුෂ්‍ය පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නට ද ගළවා ගන්නට ද වැඩම කළ සේක." මෙම ජේසු ප්‍රකාශය හා බැඳෙන්නේ,
(1) ධනවත් ප්‍රධානියාගේ කථාවයි. (2) ලෙවී කැඳවීමේ කථාවයි.
(3) සාකෙවුස්ගේ කථාවයි. (4) ශතාධිපතියාගේ කථාවයි.

**3.** ස්නාවක ජොහන්ගේ දේශනා අද සමාජයේ යථාර්ථයක් කිරීමට නම් කිතුනුවා
(1) විවිධාකාර භේද පිටුදැකිය යුතු ය.
(2) ධනාත්මක සමාජ පරිවර්තනයකට දායක විය යුතු ය.
(3) මුදල් රැස්කිරීමට විරුද්ධ විය යුතු ය.
(4) සමාජ ප්‍රභූන් විවේචනයට ලක් කළ යුතු ය.

**4.** දේව රාජ්‍යයේ වර්ධනය දේව බලයෙන් සිදුවන බව පැහැදිලි කරන්නේ
(1) මුහුන් පිළිබඳ උපමාවයි. (2) අත්තික්කා ගස පිළිබඳ උපමාවයි.
(3) දැල පිළිබඳ උපමාවයි. (4) වපුරන්නා පිළිබඳ උපමාවයි.

**5.** පැරණි ගිවිසුමේ දුක්විඳින සේවකයා යන්න මුල දී යොදා ඇත්තේ
(1) ඉශ්‍රායෙල් ජනතාව හැඳින්වීමට ය. (2) මිසරයේ වහල් සේවකයින් හැඳින්වීමට ය.
(3) දුක්විඳි දිවැසිවරුන් හැඳින්වීමට ය. (4) ජේසුස් වහන්සේ හැඳින්වීමට ය.

**6.** කිතුනු දරුවකු වන ඔබට අසරණ වූ දරුවකුට කළ හැකි උතුම් සත්කාරය නම්
(1) ඔහුගේ සියලු අවශ්‍යතා සපයා දීමයි. (2) සුබසාධක මධ්‍යස්ථානයකට බාර දීමයි.
(3) සහෝදරත්වයෙන් නිවසට කැඳවා ගැනීමයි. (4) මිතුරු මිතුරියන්ට හඳුන්වා දීමයි.

**7.** එළිසබෙත්ගේ විශිෂ්ට චරිතාංගයක් නම්
(1) සියල්ල උපේක්ෂාවෙන් දැරීමයි. (2) හඬක් නැගිය යුතු විට හඬක් නැගීමයි.
(3) වැඩිහිටි අදහස්වලට ගරු කිරීමයි. (4) දේව කැමැත්තට ඉඩ දී කිසිවක් නොකර සිටීමයි.

**8.** කිතුනු බව්තීස්මය ලබා ඇති ඔබ විශේෂයෙන් ම
(1) කිතුනු සභාවේ සාමාජිකත්වය ලැබුවෙහි ය. (2) සම්පූර්ණ පවිත්‍රතාවක් ලැබුවෙහි ය.
(3) මනස්ථාපනයට යොමු වූයෙහි ය. (4) ශුද්ධාත්ම අනුහසට විවෘත වූවෙහි ය.

**9.** කිලිනොච්චි වැසියන්ට කරුණාව පාමින් ප්‍රේමය දැක්වූයේ
(1) බෙකර් සොහොයුරියයි. (2) ඉව්ලින් කානි සොහොයුරියයි.
(3) මියුරියල් හවින්ස් සොහොයුරියයි. (4) ගරු තම්බිරාජා පියතුමායි.

[ දෙවැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !

Agaram.lk - Keep your dreams alive !

agaram.lk

www.agaram.lk



10. "නුඹේ දෙවි ස්වාමින් වහන්සේට පමණක් නමස්කාර කරන්නැ"යි ජේසුතුමා පවසන්නේ
(1) ලෞකිකත්වයට වහල් වූවන්ට ය.
(2) භාක්කම් පසුපස දුවන්නන්ට ය.
(3) සත්‍යය හා යුක්තිය පිටුදකින්නන්ට ය.
(4) විනය විරෝධී ක්‍රියා කරන්නන්ට ය.

11. ජීවමාන ජේසුස් වහන්සේ ගැන කිතුනුවා සාක්ෂි දැරිය යුතු වන්නේ
(1) ශුභාරංචිවල සඳහන් ජේසු උත්ථානය ගැන පැවසීමෙනි.
(2) තම ජීවිත වෙනස්වීම තුළින් කිතුනු ආකල්ප ක්‍රියාවට නැංවීමෙනි.
(3) දේවදූතයින් කාන්තාවන්ට පැවසූ වදන් සන්නිවේදනය කිරීමෙනි.
(4) රෝම ශතාධිපතියාගේ සාක්ෂිය කියා පෑමෙනි.

12. කමාව පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.
A - කමාව යැදීමට පෙර කමාව පිදිය යුතු ය.
B - සීමාරහිත ව කමාව දීමට උත්සුක විය යුතු ය.
C - සුළු වැරදිවලට කමාව නොයැදිය යුතු ය.
D - වරද ප්‍රසිද්ධියේ පෙන්වා දී කමාව පිදිය යුතු ය.
මින් වඩාත් නිවැරදි වන්නේ
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) C සහ D ය.

13. ස්වාභාවික ව්‍යසන ඇතිවීමට වඩාත් ප්‍රබල හේතුවක් වන්නේ
(1) අවිචාරවත් ආත්මාර්ථකාමී මානව ක්‍රියා පිළිවෙත් ය.
(2) දෙවිඳුන්ට විරුද්ධ ව ක්‍රියා කිරීම ය.
(3) තාක්ෂණික උපකරණ බහුලව භාවිත කිරීම ය.
(4) ලොව පුරා කම්හල් වැඩි වීම ය.

14. කිතුනු සභාවට ඇති අභියෝග ජයගැනීමට මුල් කිතුනු සභාවේ මග පෙන්වීම නම්
(1) මුල් හැසිරීම් රටාවෙන් නව මගකට පිවිසීමයි.
(2) කිතුනුවන්ට පමණක් උපකාර කිරීමයි.
(3) වගකීම් හඳුනාගැනීමට තැත් කිරීමයි.
(4) හවුල් නායකත්වයෙන් ප්‍රශ්න විසඳීමයි.

15. පන්දහසකට කන්න දීම තුළින් හෙළිවන ප්‍රධාන දේව ධාර්මික සත්‍යය නම්
(1) භෞතික අවශ්‍යතාවලට ප්‍රමුඛත්වය දිය යුතු බවයි.
(2) ආර්ථික ප්‍රශ්න විසඳීමට ආශ්චර්යයන් අවශ්‍ය බවයි.
(3) දේව සංරක්ෂණය කෙරේ විශ්වාසය තැබිය යුතු බවයි.
(4) සැලසුමකට අනුව ආහාර බෙදා දිය යුතු බවයි.

16. ජේසුතුමාගේ රූප විපර්යාසය මගින් ගෝලයින්ට අවබෝධ වූයේ
(1) එතුමාගේ දුක්විඳීමයි.
(2) එතුමාගේ විනිශ්චයයි.
(3) එතුමාගේ ප්‍රේමයයි.
(4) එතුමාගේ දේව ස්වභාවයයි.

17. කිතුනු ඒකත්වයේ අභියෝගයට මුහුණ දෙන අප
(1) විවිධත්වය නොසලකා හැරිය යුතු ය.
(2) හිස වන ක්‍රිස්තුන් වහන්සේ තුළ එක ම රැළක් විය යුතු ය.
(3) තමන්ගේ සාම්ප්‍රදායික වත් පිළිවෙත් ගැන උදම් ඇණිය යුතු ය.
(4) අන්‍යාගමිකයන් පිටුදැකිය යුතු ය.

18. පරිසිවරයාගේ හා අයකැමියාගේ උපමාවේ, අයකැමියාගෙන් ඔබ චරිතායතනය කළ යුත්තේ
(1) පසුතැවිල්ලෙන් තම අනන්‍යතාව පිළිගැනීමේ චරිත ලක්ෂණයයි.
(2) තමා ගැන අධිතක්සේරුවක යෙදීමේ චරිත ලක්ෂණයයි.
(3) අන්‍යයන් හා තමා සැසඳීමේ චරිත ලක්ෂණයයි.
(4) තම පෞරුෂත්වය ගොඩනැගීමට තැත් කිරීමේ චරිත ලක්ෂණයයි.

19. ජීවිත පෙරළියෙන් පසු පාවුල්ගෙන් දිස් වූ සුවිශේෂී ලක්ෂණය වූයේ
(1) පුරවැසිභාවය අතහැර දැමීම ය.
(2) දේව මග පෙන්වීමෙන් තීරණ ගැනීම ය.
(3) ජුදෙව්වන් ප්‍රතික්ෂේප කිරීම ය.
(4) පරිසි නීතියට වහල් වීම ය.

20. ජුදෙව් මෙසියස් බලාපොරොත්තුව ඉක්මවූ ජේසුස් වහන්සේ අනුගමනය කරන ඔබ
(1) මුළුමනින් ම දේශපාලනයෙන් බැහැර විය යුතු ය.
(2) මෙසියානු සංකල්පය නිර්වචනය කළ යුතු ය.
(3) පූර්ණ විමුක්තිය කරා ගමන් කළ යුතු ය.
(4) විමුක්තිය සඳහා සටන් පාඨ පැවසිය යුතු ය.

21. ඔබේ ප්‍රදේශයේ අන්‍යාගමික සිද්ධස්ථානයක් ප්‍රතිසංස්කරණය කිරීමේ දී ඔබ
(1) දේවගැතිතුමාගේ අවසරය මත ඊට සහභාගි විය යුතු ය.
(2) රහසින් ගොස් ඊට සහභාගි විය යුතු ය.
(3) කිතුනු අනන්‍යතාව රැකගෙන ඊට සහභාගි විය යුතු ය.
(4) අන්‍යාගමික කටයුත්තක් නිසා ඊට සහභාගි නොවිය යුතු ය.

[ තුන්වැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**22.** පිලාත් ආණ්ඩුකාරයා ඉතිහාසයට එක්වූයේ
(1) යුක්තියට පිටුපා තනතුරු රැකගන්නෙකු ලෙස ය.
(2) නිවැරදි දේ කිරීමට ආත්ම ශක්තියක් නැත්තෙකු ලෙස ය.
(3) ජන හඬට සවන් නොදුන්නකු ලෙස ය.
(4) හෙරෝද්ට ත්‍යාග යැවූ කෙනකු ලෙස ය.

**23.** නඟුලට අත තබා ආපසු නොබලන්නා
(1) තිර අදිටනින් සේවය ඉදිරියට ගෙන යන්නෙකි.
(2) සියල්ලන්ගේ ආශිර්වාදයෙන් දේව රාජ්‍යය පතළ කරන්නෙකි.
(3) ලෞකික ජීවිත රටාවෙන් සමු ගන්නෙකි.
(4) පරිණත වූ පසු සේවය අරඹන්නෙකි.

**24.** නොමග ගිය කෙනකු ඔබ වෙත පැමිණියහොත් ඔබ කළ යුත්තේ
(1) නොමග යෑමට බලපෑ හේතු විමසීමයි.
(2) පසුතැවිලි වීමේ වටිනාකම පහදා දීමයි.
(3) දේවගැතිතුමා වෙත යොමු කිරීමයි.
(4) අසීමිත දේව ප්‍රේමයෙන් පිළිගැනීමයි.

**25.** ධනවතුන් විසින් දිළිඳුන් නොසැලකීමේ වරද ජේසුතුමා පෙන්වා දුන්නේ
(1) ධනවත් ප්‍රධානියා පිළිබඳ කථාවෙනි.
(2) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාවෙනි.
(3) පොහොසතා සහ ලාසරුස් පිළිබඳ උපමාවෙනි.
(4) රන්කාසි දසය පිළිබඳ උපමාවෙනි.

**26.** දේවස්ථාන ආශ්‍රිත ව කෙරෙන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.
A - අරමුදල් තර කිරීම සඳහා සල්පිලක් සහ සැණකෙළියක් පැවැත්වීම
B - නිරාහාර යාච්ඤාවකින් පසුව සංග්‍රහයක් භුක්ති විඳීම
C - අවශ්‍ය අවස්ථාවල දී ආත්ම ප්‍රබෝධන මෙහෙයයන් පැවැත්වීම
D - දේව මෙහෙයයන්වලට දේශීය තූර්යවාදනය යෙදීම
මෙයින් දේවස්ථාන ආශ්‍රිත ව කිරීමට **නුසුදුසු** ක්‍රියාකාරකම් වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) C සහ D ය.

**27.** අනුන් වෙනුවෙන් වැය වීම ක්‍රියාත්මක වූ අවස්ථාවක් නම්
(1) යම් කෙනකු මුළු දිනයේ ම තම කුඹුරේ වැඩ කිරීමයි.
(2) මගදී හමු වූ අසාධ්‍ය රෝගියකු රෝහල්ගත කිරීමයි.
(3) ඉරිදා පැවැති තරගයකට ගම නියෝජනය කිරීමයි.
(4) රැකියාවට යාමට පෙර තම ආරක්ෂාව වෙනුවෙන් යාච්ඤා කිරීමයි.

**28.** වර්තමාන කිතුනු කාන්තාවගේ ප්‍රධාන භූමිකාව විය යුත්තේ
(1) කිතුනු උත්සව සඳහා සංග්‍රහ කිරීම ය.
(2) කාන්තා සමිති තුළින් ක්‍රියාකාරී වීම ය.
(3) දේවගැතිවරියන් වීමට ඉල්ලුම් කිරීම ය.
(4) හැකි සෑමවිට ම කිතුනු මෙහෙවරේ යෙදීම ය.

**29.** එදා ජේසුතුමා පැවසූ පරිසි විනයධරයින්ගේ ඇතුළාන්ත හිස්කම, අද දිස්වන්නේ
(1) මාපියන් නොසලකන දරුවන් ඔවුන් මියගිය පසු ස්මාරක තනන විට ය.
(2) සමහරුන් වැඩිහිටි නිවාසවලට යන විට ය.
(3) සමහරුන් විශේෂ අවස්ථාවල දී දේව නමස්කාරයේ යෙදෙන විට ය.
(4) සමහරුන් නොකඩවා ම දන්දීමෙහි යෙදෙන විට ය.

**30.** අපලාප කළ පේදුරුට **ප්‍රතිවිරුද්ධ** විය යුතු කිතුනුවා
(1) ප්‍රශ්න මැද නිහඬ විය යුතු ය.
(2) අන්‍යයින්ගේ අදහස් බැහැර කළ යුතු ය.
(3) තම ක්‍රියා සාධාරණීකරණය කළ යුතු ය.
(4) තම සුරක්ෂිතභාවය නොසැලකිය යුතු ය.

**31.** සිය මුල් ජීවන පසුබිම නිසා සාවුල්ගේ දහම් සේවය ලැබූ වරප්‍රසාදයක් වූයේ කුමක් ද?
(1) අන්‍ය ජාතීන්ගේ අපෝස්තුළුවරයා වීමයි.
(2) අන්‍ය ජාතික පරිසරයක විවිධ සංස්කෘති මධ්‍යයේ ජීවත් වීමයි.
(3) ඔහුට පමණක් කුඩාරම් තැනීමේ ක්‍රියාකලාපයයි.
(4) ක්‍රියාකාරී ධර්ම දේශකයකු වීමයි.

**32.** ජේසුතුමා සමග ජීවත් වන තරුණ අය ජීවිත පෙරළියක් සඳහා
(1) නිර්මල වූත් සදාචාරාත්මක වූත් දිවියකට පිවිසිය යුතු ය.
(2) සමාජයේ තරගකාරිත්වයට ඇතුළත් විය යුතු ය.
(3) සෑමවිට ම නායකත්ව භූමිකාවක් රඟ පෑ යුතු ය.
(4) අයහපත් මිතුරු ආශ්‍රයෙන් වැළකිය යුතු ය.

[ හතරවැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



2925

Agaram.lk - Keep your dreams alive !

**33.** එදා ජුදෙව් සමාජයේ පැවති, වත්මන් කිතුනු සභාවේ දක්නට **නොලැබෙන** අංගයක් වනුයේ
(1) ශුද්ධ ලියවිලි දේව ආනුභාවයෙන් ලියැවුණු බව පිළිගැනීමයි.
(2) ආගන්තුක සත්කාර කිරීමයි.
(3) මෝසෙස්ගේ නීතිය බාහිර ලෙස අකුරට පිළිපැදීමයි.
(4) පරම්පරානුගත ඉඩම් බෙදා දීමයි.

**34.** "පළමුකොට ඔබේ ම ඇසෙන් ලී කොටය ඉවත ලන්න." ජේසුතුමාගේ මෙම ඉගැන්වීම අවධාරණය කළ යුත්තේ
(1) කෙනෙකුගේ ක්‍රියාවක් විවේචනය කිරීමට සිතෙන විට ය.
(2) කෙනෙකුගේ හොඳ ක්‍රියාවක් සැඟවීමට සිතෙන විට ය.
(3) කෙනෙකුගේ දක්ෂකමක් ප්‍රසිද්ධ කිරීමට සිතෙන විට ය.
(4) කෙනෙකු ගැන ප්‍රශංසාවක් කිරීමට සිතෙන විට ය.

**35.** පහත දැක්වෙන කරුණු සලකා බලන්න.
A - නිවැරදි ක්‍රමවේදයක් අනුගමනය කිරීම
B - අභියෝග ඉදිරියේ නොසැලී සිටීම
C - හාස්කම් මත පමණක් රැඳී සිටීම
D - අත්දැකීම් පෙරටු කොට ගෙන සාක්ෂි දැරීම
මින් කිතුනු මෙහෙවර සඳහා පාවුල්ගේ මග පෙන්වීම ලබන කිතුනුවාගේ කාර්භාරය විය යුත්තේ
(1) A, B සහ C ය. (2) A, B සහ D ය. (3) A, C සහ D ය. (4) B, C සහ D ය.

**36.** කිතුනු බලාපොරොත්තුව පිළිබඳ ව පහත දැක්වෙන කරුණු කිහිපය සලකා බලන්න.
A - සදාතන ජීවනය ලැබීම
B - ජේසුතුමාගේ දෙවන පැමිණීම
C - පැරණි ගිවිසුමේ පොරොන්දු ඉටු කිරීම
D - මෙසියස් සේවය පිළිබඳ ධර්මදූත සේවය නවතාවයට ගෙන ඒම
මින් කිතුනු බලාපොරොත්තුව පිළිබඳ වඩාත් යෝග්‍ය කරුණු වන්නේ
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) C සහ D ය.

**37.** පහත දැක්වෙන කරුණු සලකා බලන්න.
A - සියලු වහල්භාවයන් පිටුදැකීම
B - ස්වභාව ධර්මය අගය කිරීමට පෙලඹවීම
C - දේව සබඳතා සහ මානව සබඳතා ගොඩනැගීම
D - බෙදීම් ඉක්මවා යන නව අනන්‍යතාවක් ඇති කිරීම
මින් බහුවිධ සමාජය තුළ සාමය හා සහජීවනය ඇති කිරීමේ මූලික ප්‍රයත්න විය යුත්තේ
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) C සහ D ය.

**38.** ආධ්‍යාත්මික හා ආර්ථික දරිද්‍රතාව නැති කළ **නොහැක්කේ**
(1) සහනාධාර කටයුතු පුළුල් කිරීමේ දුෂ්කරතා නිසා ය.
(2) භෞතික දෑ විනාශ වන බව පිළිගැන්වීමේ දුෂ්කරතා නිසා ය.
(3) සම්පත් නාස්තිය වැළැක්වීමේ දුෂ්කරතා නිසා ය.
(4) යුක්තිය හා සමානත්වය ඇති කිරීමේ දුෂ්කරතා නිසා ය.

**39.** පහත දැක්වෙන කරුණු සලකා බලන්න.
A - අලංකාර දේව මාලිගාව රැක ගැනීම
B - ප්‍රීතියෙන් සාක්ෂි දැරීම
C - යුගාන්තයේ දී ජයාන්විත භාවයෙන් සහභාගී වීමේ බලාපොරොත්තුව
D - ස්වාභාවික ආපදා යුගාන්ත ලකුණු සේ සැලකීම
මින් යුගාන්තය පිළිබඳ අනාවැකි මගින් ජේසුතුමා අවධාරණය කළ කරුණු වන්නේ
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) C සහ D ය.

**40.** ආගන්තුක සත්කාරය පිරිනැමීම පිළිබඳ ව ජේසුතුමා දුන් ඔවදනක් වන්නේ කුමක් ද?
(1) "ඔබ කැඳවනු ලැබූ කල ගොස් පහත් ම ස්ථානයෙහි හිඳගන්න."
(2) "දිළිඳුන් ද අබ්බගාතයන් ද කොරුන් ද කැඳවන්න."
(3) "දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි කෑම වළඳන තැනැත්තේ භාග්‍යවන්තයෙකි."
(4) "තමන් පහත් කර ගන්නා උසස් කරනු ලැබේ."

* *

[ පස්වැනි පිටුව බලන්න

agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

ක්‍රිස්තියානි ධර්මය I, II
கிறிஸ்தவம் I, II
Christianity I, II

## ක්‍රිස්තියානි ධර්මය II

✳ **පළමුවන** ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) ගාබ්‍රියෙල් දේවදූතයාගෙන් විශේෂ උපත් පිළිබඳ ශුභ ආරංචි ලැබූ **දෙදෙනා** නම් කර, ඔවුන්ගේ ප්‍රතිචාර මොනවා දැ'යි දක්වන්න.

(ii) "**ගොයම** නම් බහුල ය. **ගොවීහු** විරල ය. එබැවින් මෙහෙකරුවන් එවන ලෙස ගොයමේ හිමියන්ට යාච්ඤා කරන්න."

(a) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කා හට ද?

(b) තද කළු අකුරෙන් යෙදී ඇති පද පැහැදිලි කරන්න.

(iii) (a) 'විද්‍යාවේ යතුර හිමියන්' ලෙස ලූක් සුබසුනේ සඳහන් වන්නේ කවරහු ද?

(b) ඔවුන්ගේ බරපතල වරද ලෙස ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ කුමක් ද?

(iv) ජේසුස් වහන්සේ සේවය කළ සමාජයේ දරුවනට නිසි ගෞරවයක් හා පිළිගැනීමක් ලබාදීමට ක්‍රියා කළ අවස්ථා **දෙකක්** ඉදිරිපත් කරන්න.

(v) "මුළු ඊශ්‍රායෙල් ජනතාව අතරවත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දැක නැත." .........

(a) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කවරෙක් පිළිබඳව ද?

(b) එයින් කිතුනු අප ලබන ආදර්ශය කුමක් ද?

(vi) "ඔබගේ ඉඟ පටිය බැඳගන්න, පහන් ද දල්වා තබා ගන්න."

(a) මෙය ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද?

(b) එයින් අදහස් කෙරෙන්නේ කුමක් ද?

(vii) (a) ගීතාවලියේ 23 වන ගීතයෙන් බැටළු එඬේරාණන් වශයෙන් දැක්වෙන්නේ කා පිළිබඳව ද?

(b) ජේසුස් වහන්සේ 'යහපත් බැටළු එඬේරා' යන සංකල්පය පරිපූර්ණ කළේ කෙසේ ද?

(viii) "ඔබ පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න."

(a) ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ අවස්ථාව කුමක් ද?

(b) එයින් ඉදිරිපත් කෙරෙන සත්‍යය කුමක් ද?

(ix) (a) ජෙරුසලමේ මන්ත්‍රණ සභාව කැඳවීමේ අරමුණ කුමක් ද?

(b) එහි නායකත්වය දැරුවේ කවුද?

(x) කිතුනු පවුලක් සාර්ථක ව ගෙනයෑම සඳහා දෙමව්පියන්ගෙන් හා දරුවන්ගෙන් බලාපොරොත්තු වන වගකීම් එක බැගින් ලියන්න.

(ලකුණු 2 × 10 = 20යි)

**2.** (i) 'මෙසියස්' යන්නෙහි අර්ථය කුමක් ද? ජෙරුසලමේ දේව මාලිගයේ දී ජේසු බිළිඳා මෙසියස් ලෙස හඳුනාගත්තේ කවුරුන් විසින් ද?

(ii) ජේසුස් වහන්සේගේ දෙමව්පියන් එතුමා සම්බන්ධයෙන් ඉටු කළ ජුදෙව් චාරිත්‍ර **තුනක්** ලුහුඬින් ඉදිරිපත් කරන්න.

(iii) ශ්‍රී ලාංකික සමාජය තුළ කිතුනු ආගමික චාරිත්‍ර හා කිතුනු අනන්‍යතාව රැකගෙන අන් අය ආකර්ෂණය වන පරිදි ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේ ද?

(ලකුණු 10යි)

**3.** (i) ජේසුස් වහන්සේ සිය සේවය ඇරඹුයේ කුමන නගරයෙන් ද? සිය සේවය ගැන ධර්මශාලාවේ දී උන් වහන්සේ කියැවූයේ කුමන දිවැසිවර ග්‍රන්ථයෙන් ද?

(ii) ජේසුස් වහන්සේගේ සේවය පිළිබඳ ව උන් වහන්සේ කියැවූ පාඨයේ අඩංගු වූ විශේෂිත කරුණු, උන් වහන්සේගේ සේවයේ දී ඉටු කළ අන්දම උදාහරණ සහිත ව දක්වන්න.

(iii) ඉහත (ii) ට අදාළ ව ඔබ විසින් දක්වන ලද, වත්මන් සමාජයේ ද දක්නට ලැබෙන එවැනි අවස්ථා ඉදිරිපත් කර, කිතුනුවන් ලෙස අපට ගත හැකි ක්‍රියාමාර්ග කවරේ දැ'යි පහදන්න.

(ලකුණු 10යි)

[ හයවැනි පිටුව බලන්න

Agaram.lk - Keep your dreams alive !

Agaram.lk - Keep your dreams alive !

agaram.lk

www.agaram.lk



**4.** මානව හිමිකම් ගිලිහී ගොස් ඇති බව නිතර අපට දැනගන්නට ලැබේ.

(i) ජේසුස් වහන්සේ මෙලොව සේවය කළ කාලයේ දී හිංසනයට හා පීඩනයට ලක්වී සිටි ජන කොටස් **දෙකක්** ගැන පුහුඩින් පැහැදිලි කරන්න.

(ii) ජේසුස් වහන්සේ එබඳු ජන කොටස් වෙනුවෙන් ක්‍රියාකර, ඔවුනට සමාජ හිමිකම් ලබා දුන් අවස්ථා **තුනක්** සඳහන් කරන්න.

(iii) ශ්‍රී ලාංකික ජන සමාජයේ ජනතාව මුහුණපාන හිංසන හා පීඩන **පහක්** සඳහන් කර, එබඳු අවස්ථාවල කිතුනු ප්‍රතිචාරය කෙසේ විය යුතු දැ'යි පහදන්න.

(ලකුණු 10යි)

**5.** (i) ශුද්ධ වූ පාවුල්තුමා රෝමයට සිරකරුවකු ලෙස ගිය ගමනේ දී මුහුණ දුන් අභියෝග **දෙකක්** පුහුඩින් ලියන්න.

(ii) අර්බුදය මැද පාවුල්තුමා ආදර්ශමත් නායකත්වයක් දුන් අන්දම පහදන්න.

(iii) පාවුල්තුමාගේ එම ආදර්ශය අනුව කිතුනු අප අර්බුදකාරී තත්ත්ව ඉදිරියේ කෙසේ ක්‍රියා කළ යුතු දැ'යි විස්තර කරන්න.

(ලකුණු 10යි)

**6.** (i) ජේසුස් වහන්සේ විසින් සීමොන් පේදුරු සහ මතෙව් කැඳවූ අවස්ථාවේ දී ඔවුන් දැක්වූ ප්‍රතිචාර කෙසේ වී ද?

(ii) ජේසුස් වහන්සේ එදා ජුදා සමාජ තත්ත්වය ඉක්මවා ශ්‍රාවකයන් කැඳවීමේ හා එහි සංයුතියේ විශේෂිත වූ ලක්ෂණ **තුනක්** ඉදිරිපත් කරන්න.

(iii) වත්මන් සමාජය උදෙසා කිතුනු අනුගාමිකත්වය දරන අපගෙන් ජේසුස් වහන්සේ බලාපොරොත්තු වන්නේ මොනවා දැ'යි පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

**7.** (i) පරිසිවරු ජුදා සමාජයේ කෙබඳු තත්ත්වයක් දැරුවේ ද? ඔවුන්ගේ ආගමික කටයුතුවල මධ්‍යස්ථානයක් වූයේ කුමක් ද?

(ii) සීමොන් පරිසිවරයාගේ නිවසේ දී ජේසුස් වහන්සේ පිළිගැනීමේ දී පැහැර හරින ලද ජුදා චාරිත්‍ර **තුනක්** ලියන්න.

(iii) පරිසිවරුන්ගේ පුහු ධාර්මිකභාවය හෙළා දකිමින් ජේසුස් වහන්සේ ක්‍රියා කළ අන්දම අනුගමනය කරමින් කිතුනු අප සමාජයේ ක්‍රියා කළ යුතු ආකාරය කරුණු **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

* * *

Agaram.lk - Keep your dreams alive !

Agaram.lk - Keep your dreams alive !

agaram.lk